# දේශීය පුස්කොළ පොතක අන්තර්ගත ගර්භිණී, ප්‍රසව සහ සූතිකා රෝග චිකිත්සාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

දිසානායක එස්. ඒ.[1], වක්කුඹුර එච්. පී.[1], ගුණානන්ද හිමි, මාවතවැව[3]

[1]කෞමාරභෘත්‍ය සහ ස්ත්‍රී රෝග අධ්‍යයනාංශය, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය, කැලණිය විශ්වවිද්‍යාලය, යක්කල.

[2]උතුරු මධ්‍යම දිසාවේ ප්‍රධාන අධිකරණ සංඝනායක, ශ්‍රී සුධර්මාරාමය, කුඹුක්ඇන්ද, මහඉළුප්පල්ලම.

**සංක්ෂිප්තය**

ශ්‍රී ලංකාවට අනන්‍ය වූ දේශීය වෛද්‍ය ක්‍රමය වර්තමානය තෙක් නොනැසී පැවතීම සඳහා හේතු වූ ප්‍රමුඛතම සාධකයක් ලෙස දේශීය වෙදකම ග්‍රන්ථාරූඪ කළ පුස්කොළ පොත් සැලකිය හැකි ය. විවිධ වෛද්‍ය පරම්පරා සතු ව පැවති පුස්කොළ පොත් තුළ ශ්‍රී ලංකාවට ආවේණික වූ ප්‍රායෝගික චිකිත්සා ක්‍රමයන් රාශියක් අන්තර්ගත ව ඇත. විවාහයේ සිට නිරෝගී දරුවකු මෙලොවට බිහි කිරීම දක්වා වන කාල පරාසය තුළ කළ යුතු සියලු ම පිළිවෙත් දේශීය ගර්භිණී සහ සූතිකා වෙදකම තුළ අන්තර්ගත වේ. දේශීය පුස්කොළ පොතක අන්තර්ගත ගර්භිණී, ප්‍රසව සහ සූතිකා රෝග චිකිත්සාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් සිදු කිරීම මෙම පර්යේෂණයේ අරමුණ විය. මෙම පර්යේෂණය සඳහා වෙට්ටංකුලමේ සුනන්ද භික්ෂුන් වහන්සේ විසින් රචිත යැයි සැළකෙන පුස්කොළ පොතක් භාවිත කරන ලදී. එහි අන්තර්ගත ව ඇති ගර්භිණී රෝග, ප්‍රසව රෝග සහ සූතිකා රෝග සඳහා භාවිත කරන ලද ඖෂධ වර්ග, ඖෂධ සංස්කරණ විධි, මාන භාවිතය, අනුපාන උපයෝගීත්වය යන මූලික කරුණු පිළිබඳ ව දත්ත රැස් කරන ලදී. දත්ත විශ්ලේෂණය කිරීමේ දී චිකිත්සාවන් සියල්ල කවි භාවිත කර ගර්භිණී, ප්‍රසව සහ සූතිකා යන අවස්ථා සඳහා පිළිවෙළින් විස්තර කර ඇති බව පෙනී යයි. ගර්භිණී අවස්ථාව සඳහා චිකිත්සාව දැක්වීමේ දී ගර්භ වර්ධනය, ගර්භිණී ශූල, ආම, රක්ත, උණ සහ අතීසාර යන රෝග අවස්ථා සඳහා ද ප්‍රසූත කාළය තුළ දී දරුවන් පහසුවෙන් බිහි වීමට, මළ දරුවන් බිහි කිරීමට සහ විශේෂ අපරා පාතනයට ද සූතිකා රෝග වශයෙන් ශූල, සන්නි, ක්ෂීර දෝෂ සහ ලේ මාලයට ද විශේෂ වශයෙන් ප්‍රතිකාර දක්වා ඇත. මෙම ප්‍රතිකාර සඳහා භාවිත කර ඇති ඖෂධ සියල්ල පහසුවෙන් සොයා ගත හැකි සේ ම පහසුවෙන් සංස්කරණය කළ හැකි වීම ද විශේෂ ලක්ෂණයකි. ඒ අනුව ස්වරස, කෂාය, කිරි කෂාය, චූර්ණ, කල්ක වශයෙන් අභ්‍යන්තරවත් ආලේප වශයෙන් බාහිරවත් ඖෂධ භාවිත කිරීමට උපදෙස් දී ඇත. උද්භිද ඖෂධ මෙන් ම ජාන්තව ඖෂධ ද චිකිත්සා කර්මය සඳහා උපයෝගී කරගෙන ඇති අතර ඖෂධ සංස්කරණයේ දී සහ ඖෂධ නිර්දේශ කිරීමේ දී මාන භාවිතය සහ අනුපාන භාවිතය චිකිත්සාවෙහි විශේෂ ලක්ෂණ වේ. මෙම කරුණු සියල්ල සැලකීමේ දී පැහැදිලි වන්නේ දේශීය වෛද්‍ය ක්‍රමය තුළ ගර්භිණී, ප්‍රසව සහ සූතිකා රෝග සඳහා පහසුවෙන් භාවිත කළ හැකි වූත් ප්‍රායෝගික වූත් අංග සම්පූර්ණ වූත් ප්‍රතිකාර පද්ධතියක් පැවතුණ බව යි.

**ප්‍රමුඛ පදඃ** ගර්භිණී, ප්‍රසව, සූතිකා, චිකිත්සාව

**විද්‍යුත් ලිපිනයඃ** achini85surandi@gmail.com